ලියාපදිංචි කිරීම් ආ 74

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## අයදුම්පත් කැඳවීමේ දැන්වීම

**.......................................... දිස්ත්‍රික්කයේ ...................................... කොට්ඨාසයේ**

**උප්පැන්න, මරණ හා ...................................................................... කොට්ඨාසයේ**

**විවාහ / අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

**සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය**

ඉහත සඳහන් ධුරය සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත නියමිත ලි.ප.ආ 75 ආකෘතියෙහි (තම අත් අකුරින්) පුරවා එවිය යුතුය. නියමිත ආකෘතිපත්‍ර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් (www.rgd.gov.lk) හෝ මෙම කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත හැක.

02. සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිස්ත්‍රික් ලේකම් /අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත වර්ෂ 20............ක් වූ....................................... මස ................වෙනි දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන්නට, ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.

i. <u>අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය</u>. "ශ්‍රී ලාංකික" යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකාවේ පුරවැසියෙක් වීමය.

ii. <u>පදිංචිය</u> - ........................................................... උප්පැන්න, මරණ කොට්ඨාසයට හා ........................................................................... විවාහ/ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) කොට්ඨාසයට ඇතුළත් ඇමුණුම I හි සඳහන් ගම/ ග්‍රාම නිලධාරි වසම තුළ තමාටම හිමි නිවාස ඇති සහ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි පදිංචිව සැහෙන දේපළක් අයිතිව ගම්වාසීන්ගේ සැලකුම් ලබන අය විය යුතුයි. ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත්ව තිබිය යුතුය..

iii. <u>චරිතය</u> - අයදුම්කරුවන් යහපත් චරිතයක් ඇති අය විය යුතු අතර, එය සනාථ කිරීමට පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන චරිතය හා පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්. 04 සහතිකය), ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිගෙන් ලබා ගන්නා ලද වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

iv. <u>ආදායම් තත්ත්වය</u> - අයදුම්කරුගේ දේපළ හා ඉඩකඩම් වලින් ලැබෙන, ලේඛන මඟින් සනාථ කළ හැකි වාර්ෂික ආදායම රු. 300,000/- ට වැඩි විය යුතු අතර අයදුම්කරු ණය බරින් නිදහස් විය යුතුය. දේපළ ඉඩකඩම් අයිතිය තහවුරු කිරීම සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් මාස 6 ක් ඇතුළත ලබා ගන්නා ලද පත්ඉරු ඉදිරිපත් කළ යුතුය.

v. <u>වයස</u> - අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 නොඉක්මවිය යුතුය.

vi. <u>විවාහක තත්ත්වය</u> - අයදුම්කරුවන් විවාහක අය විය යුතුය.
වැන්දඹු හෝ දික්කසාද අය නොවිය යුතුය.
(විවාහ රෙජිස්ට්‍රාර් ධුරයකට අයදුම්කරන්නන් සඳහා පමණක් අදාළ වේ.)

vii. <u>අධ්‍යාපන සුදුසුකම්</u> - අ) උප්පැන්න, මරණ සහ විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය සඳහා මූලික සුදුසුකම්

කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 03ක් සහිතව විෂයන් 06කින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

සැ.යු. - අ.පො.ස. (සා.පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සලකනු ලැබේ. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සලකනු ලැබේ.

viii. <u>සමාජ තත්ත්වය, ජනප්‍රසාදය -</u> අයදුම්කරුවන් ප්‍රදේශවාසීන්ගේ සුභසාධනය සඳහා දේශපාලන නොවන ස්වෙච්ඡා සංවිධාන කෙරෙහි දැක්වූ සහභාගීත්වය, දැරූ තනතුරු සහ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දැක්වූ සහභාගීත්වය පිළිබඳ ප්‍රශංසනාත්මක ලිපි ආදිය හා වැදගත් පවුල් පසුබිම පිළිබඳ සලකා බලනු ලැබේ.

ix. <u>පෞරුෂය</u> - අයදුම්කරු මනා පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය. ශාරීරිකව හා මානසිකව ආබාධිත තත්ත්වයේ පසු නොවිය යුතුය.

x. <u>යෝජිත කාර්යාලය පිහිටි ස්ථානය :-</u>

- **i.** කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතුය.
- **ii.** රෝහල් කොට්ඨාසයක උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධූරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි.මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

04 . <u>ඉල්ලුම් කිරීමට නුසුදුසු අය -</u>

i. පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන වශයෙන් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක හෝ පත්වීම් ලබා ඇති අය.

ii. අධිකරණයකින් වරදකරුවකු බවට පත් වූ අය හෝ මේ වන විට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවක විත්තිකරුවකු වී ඇති හෝ නඩු පැවරීමකට අදාළව මේ වන විට අධිකරණය/ පොලිසිය හෝ එවැනි ආයතනයක් මඟින් පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින අය.

iii. නීතිඥ, නොතාරිස්, ඉංජිනේරු හා ගණකාධිකාරි වැනි වෘත්තීන්හි යෙදී සිටින අය.

iv. මාසික දීමනාවක් ලබන මහජන නියෝජිතයින් (පාර්ලිමේන්තු / පළාත් සභා/ මහනගර සභා/ නගර සභා/ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වැනි අය)

v. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වනු ලැබූ රජයේ සේවකයින් ( ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 7:1 වගන්තිය)

vi. පූජ්‍ය පක්ෂය

05. තෝරා ගනු ලබන අයදුම්කරු වෙත පත්වීම ප්‍රදානය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා වූ හා මින්මතු පනවනු ලබන්නා වූ නීති රීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කරන බවට ඔහු බැඳී සිටීමේ කොන්දේසියට යටත්ව සහ එකොළොස් මසක පරීක්ෂණ කාලයකට භාජනය වන අයුරිනි. එකොළොස් මසක් අවසානයේ දී ඔහු රාජකාරියෙහි ස්ථිර කිරීමට සුදුසු බව පෙනී යන්නේ නම්, ස්වකීය කාර්යයන් සම්බන්ධ අණපනත් පිළිබඳවත්, දෙපාර්තමේන්තුවේ නීති රීති පිළිබඳවත් තම දැනීම විමසා බැලීම පිණිස පවත්වනු ලබන විභාගයකට පෙනී සිටිය යුතුය. එම විභාගයේ දී අවශ්‍ය ප්‍රමාණයට සාමාර්ථය ලබන්නේ නම් පරීක්ෂණ කාලය අවසන් වූ විට ඔහු රෙජිස්ට්‍රාර් ධුරයෙහි ස්ථිර කරනු ලැබීමට සුදුසු වේ. එකී කාලය තුළ ඔහු තනතුරට නුසුදුසු බව පෙනී යන්නේ නම් , නැතහොත් පවත්වන ලද විභාගයෙන් අසමත් වූයේ නම් දැන්වීමක් නැතිවම තනතුරෙන් ඉවත් කිරීමට පුළුවන.

06. අයදුම්පතෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමටත්, පත්වීම ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් වහාම සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වනවා ඇත.

..................................................................

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්

20............................. වැනි දින

.................................................

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

ඇමුණුම I

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**අයදුම්පත් කැඳවීමේ දැන්වීම**

**............................................... දිස්ත්‍රික්කයේ ...............................................**
**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............................................................ උප්පැන්න,**
**මරණ හා ........................................................................ කොට්ඨාසයේ විවාහ /**
**අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

**සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය**

(ඉහත තනතුර සඳහා අයදුම්කරන්නන් පහත ග්‍රාම නිලධාරි වසම/ ගම තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ අය විය යුතුය.)

| **ග්‍රාම නිලධාරි වසම්/ ගම් ලැයිස්තුව** | | |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

..............................................................

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්

..............................................................